# මහවැලි නිෂ්පාදනය

සෞභාග්‍යමත් ඉසුරු බර අනාගතයක් සහ පැහැ බර හෙටදවසක් පමණක් නොව ස්වයංපෝෂිත ශ්‍රී ලංකාවක් බිහිකිරීමට අවශ්‍යවන කෘෂිනිෂ්පාදනය වැඩිකිරීමට ප්‍රධාන කර්තව්‍යයක් කඩිනම් මහවැලිය මගින් ඉටුවේ.

මහවැලි ජනපදවල ගොවීන් පදිංචි කිරීමේ සිට ගොවීන්ට සංවර්ධන කාර්යය සඳහා ලඟාවීමට අවශ්‍යවන ප්‍රජා සංවර්ධන, කෘෂිකර්ම, ඉඩම්, ජල පාලන, අලෙවි සහ පරිපාලන යන අංශයන්හි නිල ධාරීන්ගේ සහාය ඔවුනට නොකඩවා ලැබෙන අතරම නිලධාරීන් කෙළින්ම ගොවීන් සමඟ සමීප සම්බන්ධතා පවතිවනු ලබයි.

**රත්නසිරි හේවාවසම්**

**විසිනි**

විවිධ බෝග වර්ග වගා කිරීමට අවශ්‍ය වූ කෘෂි කාර්මික තොරතුරු, පර්යේෂණ හා තාක්ෂනික තොරතුර පමණක් නොව ඔවුනට අවශ්‍ය පුහුණුව නිරතුරුව ලැබේ. ගොවීන්ට ලැබී ඇති ඉඩම අනුව බෝග වර්ග තෝරා ග නීම ඒ සඳහා අවශ්‍ය උසස් වර්ගයේ බිත්තර වී, බීජ වර්ග, පොහොර, කෘෂ රසායනික සහ වගා ණය ලබා ග නීමට අවශ්‍ය පහසුකම් ද සලසා ඇති අතරම එම ව්‍යාපාර තුලම ඔවුන්ගේ ගොවි නිෂ්පාදන උපරිම මිලකට විකුණා ගැනීමට අවශ්‍ය පහසුකම් ද සලසා ඇත.

වගා කිරීමේ සිට අලෙවිකරණය දක්වා පියවරෙන් පියවරට අවශ්‍ය පහසුකම් සලසා ඇති බැවින් මහ වැලිය ගොවීන්ගේ විශ්වාසය වඩාත් හොඳින් තහවුර කර එය ඔවුන්ගේ උනන්දුව දෙගුණ තෙගුණකර ඇත.

මුඩුබිම් කැළෑ මහවැලි සංවර්ධනයට යොමුවීමත් සමඟම ජනාවාස බවටත් එම ජනාවාස අද සරුසාර කෙත්බිම් බවටත් පත්ව ඇත. වී, මිරිස්, කව්පි මුං ඇට , රතුළූණු මෙන්ම වෙනත් අතිරේක බෝග සහ එළවළු වැනි කෘෂිකර්ම නිෂ්පාදන නිපයුම අතින් මහවැලි ජනපදවලට හිමිවන්නේ ප්‍රමුඛ ස්ථානයකි.

මහවැලි දියවර මෙන් මහවැලි ගොවි නිෂ්පාදනද දිනෙන් දින වෙළඳපොළට ලගා වෙමින් පවතී. ගොවි නිපයුම් පැමිනීමත් සමඟම විවෘත වෙළඳ පොලේ සහල්, මුං ඇට, රතුළූනු ,බීළූණු සහ එළවළු වර්ගවල මිලද ක්‍රමයෙන් අඩු වූ අතර එම හේතුවෙන් පාරිභෝගිකයාට ද විශාල සහනයක් සැලසුනි. බෝග නිෂ්පාදනයේ සරු බාවය නිසා විවිධ වාසි අද සමස්ත ආර්ථිකයටම අත්කර ගැනීමට භාග්‍යය උදාවී ඇත.

මහවැලි 'එච්' කලාපය ගැන විශේෂයෙන් සඳහන් කලොත් අප කාගෙත් සිහියට නැගෙන්නේ මිරිස් ගැනයි. සරු සාර බව කෙසේ ද කිවහොත් සෑම ගෙවත්තක්ම රතු පලසක් මෙන් ඉදුණු මිරිස් වලින් දිස්වේ.

ශ්‍රී ලංකාවේ වියලි මිරිස් වලින් සියයට 33 ක් පමණ ''එච'' කලාපයෙන් නිපදවේ. 84—85 කන්නයේ හෙක්. 6550 මිරිස් වගාකල අතර නිෂ්පාදනය ටොන් 9,150 ක් විය. 85–86 කන්නයේ හෙක්ට. : 9,710 වගාකළ අතර නිෂ්පාදනය ටොන් 11,550 කි. බීළූණු හා රතුළූණු මෙම යල කන්නයේ හොඳින් වගාකළ අතර බී ළූණු නිෂ්පාදනය මෙ.ටො. 1,448 ක් ද රතුළූණු නිෂ්පාදනය මෙ.ටො. 40 ක් ද විය.